www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකා හමුදාවේ යුද අපරාධ පිලිබඳ නව සාක්ෂි

## New evidence of Sri Lankan army war crimes

**2009 මැයි 26**

**කේ රත්නායක විසිනි**

පසුගිය සතියේ සිදුවූ එක්සත් ජාතීන්ගේ මහලේකම් බැන් කී මූන්ගේ ශ්‍රී ලංකා සංචාරය, හමුදාව හා එල්ටීටීඊ අතර මැතදී හටගත් සටන් මධ්‍යයේ පලා ගිය දෙමල සිවිල් වැසියන් මුහුනපා ඇති බිහිසුනු තත්වය දෙස මඳ බැල්මක් හෙලීමට අවස්ථාවක් සලසා තිබේ.

බැන් කී මූන්, එක් ලක්ෂ හැටදාහක් යයි සැලකෙන යුද අනාථයන් ලැගුම්ගෙන සිටින මැනික් ෆාම් නමැති දැවැන්ත රැඳවුම් මධ්‍යස්ථානය වෙත පැමිනි අතර, පසුගිය සතිය අවසානයේ සටන් සිදුවූ ප්‍රදේශය, හෙලිකොප්ටරයක සිට නැරඹීය.

හෙලිකොප්ටරයෙන් බැන් කැටුව ගමන් ගත් මාධ්‍යවේදීහු, ඡායාරූප හා ඡායාපට මගින් ඉමහත් විනාශයේ දර්ශන ප්‍රසිද්ධියට පත්කලහ. හමුදාව එල්ටීටීඊයේ ඉතිරි වී ඇති සියල්ල විනාශ කිරීමට උත්සාහ දරන අතරතුර දස දහස් සංඛ්‍යාත සිවිල් වැසියන් සති ගනනක් තිස්සේ ප්‍රදේශය තුල කොටුවී සිටියේය. ස්වාධීන වාර්තාකරුවන් ප්‍රථම වරට ඉදිරිපත් කල මෙම දර්ශන වලින්, සිවිල් ජනතාව වාසය කරන ප්‍රදේශවලට හමුදාව ඉවක් බවක් නැතිව එල්ල කල බෝම්බ ප්‍රහාර පිලිබඳ සාක්ෂි සැපයෙන අතර, ඒවා ජාත්‍යන්තර නීතියට අනුව යුද අපරාධ සේ සලකනු ලබයි.

තමන් දුටු දේ විස්තර කරමින් ටයිම්ස් වාර්තාකරු මෙසේ ලිවීය. "ගුවනේ සිට බැලූ විට යුද කලාපය විසින් ම එකකට පසු තවෙකක් වශයෙන් සාක්ෂි හෙලිදරව් කලේය. එහි දැවී ගිය මහපොලව ද පුපුරවා දැමූ තල් ගස් ද පිලිස්සී ගිය නිවාසවල සුන් බුන් ද දැකිය හැකි විය. ශ්‍රී ලංකාවේ වෙඩි මුක්ත කලාපයේ අතිශයින්ම විනාශකාරී එම දර්ශන එහි නමට ම නිගාවකි. එය පාරාදීසය තුල දිග හල නිරයේ දසුනක් විය.

දිදුලන සුදු පැහැති වෙරල, ප්‍රහාරයේ අවසන් සති වල තමන් නිකුත් කල බව ආන්ඩුව විසින් ප්‍රතික්ෂේප කරන ෂෙල් වෙඩි වලින් ආරක්ෂා වීමට, සිවිල් වැසියන් වකුටුවී සිටි අතින් හෑරූ බන්කර්වලින් ගහන විය. සුදු පැහැති වැල්ලේ ඇවුනු බව සලකුනු කරන අඟුරු පාටට හැරුනු වලවල්, පුපුරුවා හල වාසස්ථාන, අසරන බව කියාපාමින් තවමත් සුලඟට ලෙලදෙන සුදු කොඩියක් සහිත අත්හැර දැමූ බස් රථයක් හා මිනිසුන් අතහැර දැමූ දේ කියා පාන්නේ වෙනස්වූ කථාන්තරයකි."

සීඑන්එන් වාර්තාකරුවන්ට බැන් මෙසේ පැවසී ය. "මම එහිදී සම්පූර්න විනාශයක් දැක ගත්තෙමි, සිවිල් වැසියන්ගේ බොහෝ මරන සිදුවන්නට ඇත්තේ වෙඩි හුවමාරුවට මැදිවීමෙන් විය යුතුය. මම ලොව වටා ගමන්ගනිද්දී මෙවන් ස්ථාන වලට ගොස් ඇත්තෙමි. එහෙත් මේතාක් දුරට මා දැක තිබෙන අතිශය බිහිසුනු දර්ශනය මෙයයි. මම අවතැන්වූ සියල්ලන් කෙරෙහි පූර්න අනුකම්පාව පලකරමි."

යුද කලාපයෙන් ලැබෙන ඡායාරූප ගත සාක්ෂි, හමුදාව ගෙන ගියේ සිවිල් වැසියන් එල්ටීටීඊ ග්‍රහනයෙන් "මුදාගැනීමේ මානුෂික මෙහෙයුමක්" බවටත්, බර අවි යොදාගැනීම නවතා දැමූ බවටත්, ආන්ඩුව කරන කියාපෑම් සමච්චලයට ලක් කරයි. පසුගිය 19 දින පාර්ලිමේන්තුවේ දී ජනාධිපති මහින්ද රාජපක්ෂ පැවැත්වූ සිය "ජයග්‍රාහී කථාවේදී" බොරු ඇදබාමින් කියා සිටියේ එල්ටීටීඊයට එරෙහිව ගෙනගිය යුද්ධයේදී මිලිටරිය එකදු සිවිල් වැසියෙකු හෝ මරා නොදැමූ බවය.

මාධ්‍ය වෙත කාන්දු වූ එක්සත් ජාතීන්ගේ වාර්තාවක ගනන් බැලීමට අනුව ජනවාරි 20 හා මැයි 7 අතර කාලයේ සිවිල් වැසියන් 7,000 මියගොස් 17,000 පමන තුවාල ලබා ඇත. හමුදාව සිවිල් ජන ජීවිතය සාපරාධී ලෙස නොසලකා හරිමින් ඉතිරිව සිටි එල්ටීටීඊ සටන්කරුවන් ඝාතනය සම්පූර්න කල අතරවාරයේ, යුද්ධයේ අවසන් දිනවල තවත් සිය ගනනක් මිය ගියහ. අවසන් සතිය තුල ආන්ඩුවේ "වෙඩි මුක්ත" කලාපය තුල පිහිටි තාවකාලික රෝහලට තෙවතාවක් ෂෙල් වෙඩි ප්‍රහාර එල්ල විය.

ආන්ඩුවේ ප්‍රචන්ඩ ක්‍රියාවල පරිමාව පිලිබඳව තවත් සාක්ෂි ප්‍රත්සය මුල්කොට ගත් ආධාර කන්ඩායමක් වන හැන්ඩිකැප් ජාත්‍යන්තරය (එච්අයි) විසින් සපයා ඇත. එය 25 දින ඕස්ට්‍රේලියන් පුවත් පතට කියා ඇත්තේ දරුනු ෂෙල්වෙඩි හා බෝම්බ ප්‍රහාරයන් නිසා පක්ෂඝාතවූ හෝ අත් පා අහිමිවීමෙන්, යුද කලාපයේ කොටුවී සිටි 30,000 පමන මිනිසුන් අංග විකල වී ඇති බවයි. එච්අයි සංවිධානය ඔවුන් සඳහා කෘතිම අත් පා සකස් කිරීමේ යෙදී සිටියි.

ලංකාවේ එච්අයි ප්‍රධානියා වන සතිෂ් මිෂ්රා මෙසේ පැවසීය. "අත්‍යවශ්‍ය කෘතිම අවයව සැපයීම දැවැන්ත කර්තව්‍යයකි. කඳවුරු තුල සිටින අභ්‍යන්තරව අවතැන් වූ පුද්ගලයන්ගෙන් (අයිඩීපී) සියයට 9 කට පමන ශරීර අභ්‍යන්තරයේ අංග චලනය මිනුම් ගත කරන උපකරන වැනි කෘතීම අවයව හෝ මාංශපේශි හා අස්ථි ආධාරක අවශ්‍යව ඇත. එය අසාමාන්‍ය සංඛ්‍යාවකි. එහි මිනිසුන් 250,000-300,000 අතර ප්‍රමානයක් සිටින්නේ යයි සැලකුව හොත්, එසේ නම් අපට කිව හැක්කේ මිනිසුන් 25,000-30,000 අතර ප්‍රමානයකට මේ දේ අවශ්‍ය වන බවයි."

තවත් සම්මුඛ සාකච්ඡාවක දී මිෂ්රා *ටෙලිග්‍රාෆ්* පත්‍රයට කියා ඇත්තේ සරනාගතයන් කඳවුරුවල සිට තම වැඩපොල පිහිටි මඩකලපුවට පැමිනීම මත පනවා ඇති ආන්ඩුවේ තහනම නිසා සිය සංවිධානයේ වැඩ කටයුතු අඩාල වී ඇති බවයි. එහි ප්‍රතිපලය වන්නේ සහන සේවකයන්ට කෘතීම අවයව නිසියාකාරයෙන් සවිකිරීමටත් ඒවා උපයෝගී කර ගන්නා ආකාරය මිනිසුන්ට ඉගැන්වීමටත් නොහැකි වීමයි.

රාජපක්ෂ සමඟ කල සාකච්ඡාවේදී බැන්, "කඳවුරු තුලට අවහිරයකින් තොරව පිවිසීමේ හා ඒවා තුල නිදහසේ හැසිරීමට" ජාත්‍යන්තර ආධාර සංවිධානවලට ඉඩ සලසන ලෙස ඉල්ලා සිටියේය. කෙසේ වුව ද ඉරිදා නිකුත් කල නිවේදනයකින් ජනාධිපති මෙම ඉල්ලීම ප්‍රතික්ෂේප කලේ "රහසේ පිවිසෙන එල්ටීටීඊකාරයන්" තවමත් අනාථයන් අතර සිටින බව පවසමිනි. එහි මෙසේ ද සඳහන් විය. "විශේෂයෙන්ම ආරක්ෂාව පිලිබඳ තත්වය යහපත් අතට හැරුනු විට එවන් ආධාර සැපයීමට කිසිදු බාධවක් සිදු නොවනු ඇත."

දෙමල ජනතාවට අවශ්‍ය මූලික පහසුකම් ආරක්ෂාව පිලිබඳ ගැටලුවක් වන්නේ කෙසේ ද යන්න රාජපක්ෂ පැහැදිලි කලේ නැත. සැබෑව නම්, එහි යුද අපරාධ වසංකිරීම පිනිස යුද කලාපය මාධ්‍යවේදීන්ට හා බොහෝ සහන සේවකයන්ට තහනම් කල ආකාරයට ම ආන්ඩුව, රැඳවුම් මධ්‍යස්ථාන තුලට පිවිසීම තහනම් කර ඇත්තේ, ඒවා අභ්‍යන්තරයේ තත්වය වසං කිරීමටත් අවතැන් වූවන් ඔවුන්ගේ අත්දැකීම් ප්‍රකාශකිරීම වැලැක්වීමටත් ය.

මෙම "ශුභසාධන ගම්මාන" වනාහි, පිරිමි, ගැහැනු හා ලමුන් ගෙන් සැදුම්ලත් මිලියන කාලකට වැඩි දෙමල සිවිල් වැසියන් රඳවා ඇති මධ්‍යස්ථාන ය. ඇතුලත සිටින්නන්ට සලකන්නේ සරනාගතයන් ලෙස නොව සිරකරුවන් ලෙස ය. මැනික් ෆාම් කඳවුරු, මීටර් දෙකක් උසැති කටු හා මුවහත් කම්බි දැවටූ වැටවල් වලින් වටකර ඇත. කඳවුරු වටා ගැඹුරු අගල් කපා ඇති අතර සන්නද්ධ සෙබලුන් විසින් නිතිපතා රැකවල් ලා තිබේ.

එක්සත් ජාතීන්ගේ මානව කටයුතු අංශයේ ශ්‍රෙසන් බ්‍රැන්ඩෝ බීබීසී වෙත පැවසුවේ එක් කඳවුරක මිනිසුන් 74,000 රැඳී සිටිය ද එහි ඉඩ කඩ සෑහෙන්නේ ඉන් අඩකට පමනක් බව ය. මැනික් ෆාම් සංකීර්නය ලෝකයේ විශාලතම අවතැන් කඳවුර බවද ඔහු පැවසී ය.

සුදු නිල ඇඳුමින් සැරසුනු ගැහැනු පාසැල් ලමුන් කන්ඩායමක් විසින් පිලිගැනීමේ ගීතයක් ගැයීමෙන් පසුව බැන්ට මඟපෙන්වීම් සහිත සංචාරයක් සලසනු ලැබිනි. කෙසේ වුව ද යථාර්තය මුලුමනින්ම වෙනස් වූවකි. බැන් සමඟ ගමන්ගත් මාධ්‍යවෙදීහු සමහර රැඳවියන් සමඟ කථා කිරීමට අවස්ථාව සලසා ගත්හ. පලිගැනීමේ බිය නිසා ඔවුහු සිය සම්පූර්න නම් හෙලි කිරීමට මැලි වූහ.

කුමාර් ටයිම්ස් වෙත මෙසේ පැවසීය. "අපට උදව් කරන්න, අප සිටින්නේ එලිමහන් සිර කඳවුරකයි. නිදහස්ව යෑමට අපට අවශ්‍යයි. මෙහි සෑහෙන ආහාර හෝ සෞඛ්‍ය පහසුකම් කිසිවක් නැත." කොතෙක් කලක් කඳවුරේ සිටීමට සිදුවේදැයි ඔහුගෙන් විමසූ විට කුමාර් පැවසුවේ "මම දන්නෑ, සමහර විට ජීවිත කාලයටම විය හැකියි. අප මරා දමතැයි බියෙන් සිටින්නෙමු. මම ඇත්ත පැවසුවොත් මා මරා දමනු ඇත."

අමල්රාජ් නම් පියෙකු පුවත් පතට පැවසුවේ පසුගිය සතියේ කඳවුරට පැමිනි විට දුටු දෙයින් තමන් කම්පාවට පත්වූ බව ය. "දෙවන ලෝක යුද්ධ අවධියේ රැඳවුම් කඳවුරු පිලිබඳ පොතක් මම කියවා ඇත්තෙමි. මට දැනෙන්නේ අප දැන් එවැන්නක් අත්දකිමින් සිටින බවයි. දෙවන ලෝක යුද්ධයේ රැඳවුම් කඳවුරු දැන් ඇත්තේ මේ රට තුලයි."

පසුගිය සතියේ ඉන්දියානු නිලධාරීන් කොලඹට පැමිනීමෙන් පසුව, රැඳවියන් දින 180 ඇතුලත යලි

පදිංචි කරන බවට ආන්ඩුව සහතික විය. හමුදාව විසින් එල්ටීටීඊ යෙන් නැගෙනහිර "මුදාගත්" කල ද එවැනිම සහතික දී තිබුනි. දෙවසරකට පසුව ද දස දහස් ගනන් ජනතාව තවමත් අනාථ කඳවුරු තුලට වී සිටින්නේ යලි පදිංචි කිරීම පිලිබඳ කිසිදු බලාපොරොත්තුවකින් තොරව ය.

ජනයාගෙන් පිරී ඉතිරී ඇති මැනික් ෆාම් කඳවුරුවල ඇතුලත තත්වය ගැන මිනිස්සු මාධ්‍යකරුවන්ට කරුනු දැක්වූහ. ප්‍රමානවත් ආහාර නොමැතිකම, සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් නොමැතිකම ගැන ඔවහු කරුනු කීහ. බීබීසී එක් රෝහලක් ගැන මෙසේ පවසා තිබුනි. "මන්දපෝෂනයෙන් පෙලෙන රෝගීහු සේලයින් බට සහිතව එලිමහනේ ඇඳවල් මත වැතිර සිටිති. ඔවුන්ගේ හිස් වටා මැස්සන් රොක් වී සිටියි. සමහරෙක් මරනාසන්න බව පෙනෙන්නට තිබේ."

සිය ගනන් තරුන තරුනියන් ආරක්ෂක හමුදා හා ඒ සමඟ කටයුතු කරන අර්ධ මිලිටරි කල්ලි විසින් පැරගෙන ගොස් රහසිගත ස්ථානවල "එල්ටීටීඊ සැකකරුවන්" ලෙස හඳුන්වා රඳවා තබා ඇත. එක් මවක් ටයිම්ස් වෙත කියා ඇත්තේ සත්‍ය පැවසුවහොත් ඔවුන් ආරක්ෂිත බව මිලිටරිය විසින් තරුනයන්ට දන්වා තිබෙන බවය. ඇය සිය 17 වියැති දියනිය දින හතක් තිස්සේ ඇසින් නොදුටු බව ද පැවසුවාය.

පසුගිය ඉරිදා මිලිටරි ප්‍රකාශක උදය නානායක්කාර ද හින්දු පත්‍රයට පැවසුවේ එල්ටීටීඊ සාමාජිකයන් 9,100 මිලිටරිය වෙත "බාරවී" ඇති බවත්, ඉන් 7,237 දැන් "පුනරුත්ථාපන මධ්‍යස්ථානවල" රඳවා සිටින බවත් ය. එනම් කිසිදු මූලික ප්‍රජාතන්ත්‍රීය අයිතියකින් තොරව හා චෝදනා රහිතව සිරගත කොට ඇති බවයි. ඔවුන් සිටින ස්ථාන පිලිබඳව නෑදෑ හිත මිතුරන්ට දන්වනු නොලැබේ.

අලුතෙන් "මුදාගත්" උතුරේ, වයඹ දිග මන්නාරම් දිස්ත්‍රික්කයේ සිට ඊසාන දිග මුලතිව් දක්වා විශාල භූමි භාගයක් තුල මිලිටරි වාඩි ලෑමකට සමාන තත්වයක් දැනටමත් ආන්ඩුව සූදානම් කරමින් තිබේ.

හමුදා නායක ජෙනරාල් සරත් ෆොන්සේකා නේෂන් පත්‍රයට පැවසුවේ හමුදාවේ ශක්තිය ඉහල නංවා කිලිනොච්චි හා මුලතිව් හි ප්‍රධාන කඳවුරු දෙකක් පිහිටුවන බවය. ඒවා කලින් ප්‍රධාන එල්ටීටීඊ මධ්‍යස්ථාන ලෙස පැවතුනි. අනදෙන මධ්‍යස්ථාන දෙකක්, ගුවන් හමුදා කඳවුරු දෙකක් හා නව පොලිස් ස්ථානවල සවිස්තරාත්මක සැලසුම් හමුදා ප්‍රකාශක විසින් වැඩි දුරටත් ඉදිරිපත් කලේය. වයඹ හා ඊසාන දිග වෙරල තීරය දිගට තවත් මුර කපොලු නාවික හමුදාව විසින් ස්ථාපනය කරනු ඇත.

මෙම සූදානම සලකුනු කරන්නේ රාජපක්ෂ ගෙනයන්නේ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්" නොව, සිය අධිකාරය උතුරු හා නැගෙනහිර තුල පිහිටුවීමටත්, වාර්ගික රේඛා ඔස්සේ සිංහල දෙමල හා මුස්ලිම් කම්කරුවන් බෙදාලීම සඳහා වාර්ගික ආතතින් ඇවිස්සීමේත්, දෙමල ජනතාවට එරෙහි යුද්ධයක්ය යන කාරනයයි. ලක්ෂ ගනනක් දෙමල සිවිල් වැසියන්ට සලකා ඇති ආකාරය, කම්කරුවන්ගේ ජීවන තත්වයන් හා සමාජ කොන්දේසි මත ආන්ඩුව එල්ල කරන නව "ආර්ථික යුද්ධයට" විරුද්ධ වන ඕනෑම අයෙකුට ඊට නොදෙවෙනි රුදුරු ආකාරයකින් සලකන බවට දිවයින පුරා වැඩ කරන ජනතාවට කෙරෙන අනතුරු ඇඟවීමකි.

© www.wsws.org